# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/47 - 2023 ජනවාරි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 5/2021

### 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 48 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2023 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2023 අංක 1 දරන ඛනිජතෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය විසින් නිර්ණය කරනු ලැබ ඇති සහ සීමාංකනය කරනු ලැබ ඇති, නම් කරන ලද ප්‍රදේශ තුළ ඒකාබද්ධ අධ්‍යයන සිදු කිරීම සඳහා යම් තැනැත්තෙකුගේ අභිලාෂය පළ කිරීම් සඳහා වන ඉල්ලීම් අධිකාරිය විසින් කැඳවනු ලැබිය හැකි ය.

(2) අභිලාෂය පළකිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන යම් තැනැත්තෙකු විසින් යෝජිත වැඩසටහන සහ වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා වන අපේක්ෂිත කාල රාමුව (මේ නියෝගවල ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. අභිලාෂය පළකිරීම සඳහා වන ඉල්ලීම, යෝජිත වැඩසටහන සහ වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා වන අපේක්ෂිත කාල රාමුව ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ලේඛන සමග අභිලාෂය පළකිරීම සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබ ඇති තැනැත්තාගේ යෝග්‍යතාවය, පළපුරුද්ද, කීර්තිනාමය සහ මූල්‍යමය හැකියාව පිළිබඳ සඳහන් කරනු ලැබ ඇති වාර්තාවක් (මේ නියෝගවල ''මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

4. (1) 3 වන නියෝගය යටතේ ලේඛන සහ වාර්තාව ලැබීමෙන් පසුව, මණ්ඩලය විසින් වාර්තාවේ අන්තර්ගත කරුණු සහ යම් නිර්දේශ තිබේ නම්, ඒවා සලකා බැලීම මත, ඒකාබද්ධ අධ්‍යයන යෝජකයින් සඳහා වන ආදර්ශ ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම ඇතුළුව යෝජනා සඳහා වන ඉල්ලීම නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය ලබා දිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන අනුනියෝගය යටතේ මණ්ඩලයේ අනුමැතිය මත ඒකාබද්ධ අධ්‍යයන යෝජකයන්ගෙන් යෝජනා කැඳවිය යුතු ය.

5. (1) ඒකාබද්ධ අධ්‍යයන යෝජකයන්ගෙන් යෝජනා ලබා ගැනීමෙන් පසුව, මණ්ඩලය විසින්, ඒකාබද්ධ අධ්‍යයන පැවැත්වීම සඳහා ඒකාබද්ධ අධ්‍යයන යෝජකයන්ගේ පළපුරුද්ද, කීර්තිනාමය සහ මූල්‍ය හැකියාව සලකා බලමින් ඔවුන් පිළිබඳ ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, (1) වන අනුනියෝගය යටතේ සිදු කරන ලද ඇගයීමෙන් පසුව යෝජනාව පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසු, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි පිළිබඳ සාකච්ඡා ඒකාබද්ධ අධ්‍යයන යෝජකයින් සමග ආරම්භ කළ යුතු ය.

6. (1) ඒකාබද්ධ අධ්‍යයන යෝජකයා විසින්, බිම් කොටසට අදාළ අනිවාර්ය ඛනිජතෙල් දත්ත තිබේ නම්, ඒ සියල්ල මිලදී ගනු ලැබිය යුතු ය.

(2) එවැනි ඉල්ලීමක් මත, එම ඛනිජතෙල් දත්ත ඒකාබද්ධ අධ්‍යයන යෝජකයා වෙත නිකුත් කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(3) ඒකාබද්ධ අධ්‍යයන යෝජකයින් විසින්, අධිකාරියේ බලපත්‍රයක් යටතේ දත්ත ලබාගත් සේවා සමාගම සමග සෘජුවම ඕනෑම සුවිශේෂී නොවන බහු-සේවාදායක දත්තවල මිල පිළිබඳව සාකච්ඡා කළ හැකි ය.

7. (1) ඒකාබද්ධ අධ්‍යයන යෝජකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ප්‍රශ්නගතව තිබෙන බිම් කොටස විවෘතව පවත්නා කාලසීමාවක් තුළ එකම බිම් කොටසක් සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ නම්, අධිකාරිය විසින් ඒකාබද්ධ අධ්‍යයන යෝජකයන් සම්බන්ධ කර ඔවුන්ගේ තනි තනි වශයෙන් පවතින යෝජනා එක්කර තනි ඒකාබද්ධ යෝජනාවක් බවට පත් කරන ලෙස අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) ඒකාබද්ධ අධ්‍යයන යෝජකයින්ට අන්‍යෝන්‍ය එකඟතාවයකට එළඹීමට නොහැකි නම්, වඩාත්ම සුදුසු ඒකාබද්ධ අධ්‍යයන යෝජකයාට බිම් කොටස පැවරීමට අධිකාරිය විසින් තීරණය කළ හැකි ය. යෝජිත වැඩ විෂය පථය සහ වෙනත් යම් භෞතික සාධක සලකා බැලීමෙන් පසුව ගනු ලැබිය යුතු වන අධිකාරියේ තීරණය අවසන් තීරණය වශයෙන් සැලකිය යුතු ය.

8. සුදුසු ඒකාබද්ධ අධ්‍යයන යෝජකයෙකු තෝරා ගැනීමෙන් පසුව, මණ්ඩලය විසින් යෝජිත ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම සලකා බලනු ලැබීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

9. ඒකාබද්ධ අධ්‍යයනය, යෝජිත වැඩ විෂය පථයට අදාළ වන පරිදි, විදුම්, භූ තාක්ෂණික, පාරිසරික, දේශීය අන්තර්ගතය සහ දත්ත රහස්‍යභාවය ඇතුළු මාර්ගෝපදේශ සහ වෙනත් යම් නියෝගවලට යටත් විය යුතු ය. අදාළ රීතීන්, මාර්ගෝපදේශ සහ නියෝග, අධිකාරිය විසින් ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවාට සැපයිය යුතු අතර, ඒවායේ සිදුවන වෙනස්කම් ද ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා වෙත දැනුම් දිය යුතු ය.

10. ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමට අනුව, වැඩසටහන ආරම්භ කළ පසු, ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා විසින් -

(අ) ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමෙන් ආවරණය වන බිම් කොටසෙහි යම් කොටසක් තුළ වාණිජමය හයිඩ්‍රොකාබන් සොයාගනු ලැබුවේ නම්, ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා විසින් අධිකාරිය වෙත ලිඛිත දැනුම්දීමක් මගින් නිශ්චිත ප්‍රදේශය සම්බන්ධව, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත්ව සම්පත් බෙදා ගැනීමේ ගිවිසුමක් මත සුවිශේෂ සාකච්ඡා ආරම්භ කරන ලෙසට ඉල්ලා සිටිය යුතු ය. මෙම සාකච්ඡා අන්‍යෝන්‍ය ගිවිසුමක් මගින් දීර්ඝ කරනු ලැබුවහොත් මිස වසරක් තුළ අවසන් විය යුතු ය ; සහ

(ආ) ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමෙන් ආවරණය වන බිම් කොටසෙහි වෙනත් යම් බලශක්ති ප්‍රභවයක් හෝ යම් ඛනිජ ද්‍රව්‍යයක් සොයා ගත්තේ නම්, ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා විසින් ඒ සොයාගැනීම පිළිබඳව අධිකාරිය වෙත ලිඛිත දැන්වීමක් මගින් දැන්විය යුතු අතර අධිකාරිය විසින් එවැනි සොයාගැනීමක් පිළිබඳව අදාළ නියාමන ආයතනය වෙත දැන්විය යුතු ය. එවැනි බලශක්ති ප්‍රභවයක් හෝ ඛනිජ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් අදාළ නියාමන ආයතනය විසින් ස්වාධීනව එහි තීරණය ගත යුතු අතර එය අවසන් තීරණය විය යුතු ය.

11. (1) අධිකාරිය සහ ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා විසින්, ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම බලාත්මක කරනු ලබන කාලසීමාව තුළ නිශ්චිත බිම් කොටස් ප්‍රමාණය සඳහා ඛනිජතෙල් සම්පත් ගිවිසුමකට එළඹීමට ප්‍රයත්න දැරිය යුතු ය.

(2) අධිකාරිය සහ ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා විසින් 10 නියෝගයේ (අ) ඡේදය යටතේ ගිවිසුමකට එළඹීමට අපොහොසත් වන අවස්ථාවක දී, අධිකාරිය විසින්. එකී මුළු බිම් කොටස් ප්‍රමාණයට හෝ ඉන් යම් කොටසක් සඳහා බලපත්‍ර ලබාදීමේ ජාත්‍යන්තර බලපත්‍රකරණ වටයක් සඳහා ඉල්ලීම් කැඳවනු ලැබිය හැකි ය.

12. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

''ශ්‍රී ලංකාවේ කැණීම් බිම් කොටස් සිතියම'' යන්නෙන්, කැණීම් කිරීම, සංවර්ධනය කිරීම සහ හයිඩ්‍රොකාබන් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය විසින් සීමාංකනය කරනු ලැබ ඇති ප්‍රදේශ විස්තර කරනු ලබන සහ කලින් කලට ප්‍රතිශෝධනය කරන ලද නිර්ණය කරන ලද ප්‍රදේශයක බලශක්ති විභවය අධ්‍යයනය කිරීමේ සහ ඇගයීමේ අරමුණින් යුතුව, හයිඩ්‍රොකාබන් කැණීම් සහා රජය සහ මෙහෙයුම්කරුවන් එක් අයෙකු හෝ ඊට වැඩි දෙනෙකු හෝ සේවා සපයන්නන් හෝ විද්‍යාත්මක ආයතන අතර පවත්වනු ලබන වෙනත් ඒකාබද්ධ බලශක්ති ව්‍යාපෘති ආවරණය කරමින් එළඹ ඇති ගිවිසුම්වල දී, බිම් ප්‍රදේශ සීමාංකනය කිරීමේ මූලාශ්‍රය වශයෙන් භාවිතා කරනු ලබන සිතියම අදහස් වේ ;

''ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම'' යන්නට, 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත මගින් එයට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

''ඒකාබද්ධ අධ්‍යයන යෝජකයා'' යන්නෙන්, යෝජනා සඳහා වන ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ඒකාබද්ධ අධ්‍යයන යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති සහ තේරී පත්ව ඇති අයදුම්කරු අදහස් වේ ;

''ඒකාබද්ධ අධ්‍යයන හවුල්කරුවා'' යන්නෙන්, අධිකාරිය විසින් ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුමට එළඹෙනු ලබන ආයතනය අදහස් වේ.

''ඛනිජතෙල් සම්පත් ගිවිසුම'' යන්නට, 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන යටතේ එයට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

EOG 01 - 0024/1

---

එල්.ඩී.බී 5/2021

**2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත**

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 48 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2023 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

## නියෝග

1. මෙම නියෝග 2023 අංක 2 දරන ඛනිජතෙල් සම්පත් (සේවා සපයන්නන් වෙත බලපත්‍ර ලබා දීමේ නියෝග) ලෙස හැඳින්වේ.

2. (මෙහි මින්මතු ''අධිකාරිය'' ලෙස සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, කිසිදු තැනැත්තෙකු සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාරයක් සිදු කරගෙන නොයා යුතු ය.

3. සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාරයක් සිදු කරගෙන යාමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කරන ලද අයදුම්පතක් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය වන්නා වූ අවස්ථාවක දී වැඩිදුරටත් වූ තොරතුරු ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

4. අයදුම්පත්‍රය ලැබීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයදුම්පත්‍රයේ සහ ලේඛනවල ඇතුළත් කරුණු පිළිබඳ සලකා බැලීමෙන් පසුව (මේ නියෝගවල ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. 4 වන නියෝගය යටතේ වාර්තාව ලැබීමෙන් පසුව, මණ්ඩලය විසින් අයදුම්පත්‍රයේ සහ ලේඛනවල කරුණු සලකා බැලීමෙන් පසුව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවනු ලැබීමෙන් අනතුරුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා හෝ බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ තීරණය අයදුම්කරුට ලිඛිතව දැන්විය යුතු අතර, බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු දැක්විය යුතු ය.

6. සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු නොකරන ලද්දේ නම් මිස නිකුත් කළ දින සිට එක් වර්ෂයක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, එහි නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

7. බලපත්‍රලාභියා විසින් බලපත්‍රයේ යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කළ බවට අධිකාරිය සෑහීමට පත් වන්නේ නම්, 5 වන නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අධිකාරිය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

8. 5 වන නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක්, බලපත්‍රයේ කල් ඉකුත්වන දිනයට පෙර දින තිහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු වාර්ෂිකව අලුත් කරනු ලැබිය යුතු ය.

9. සේවා සපයන්නා කොන්ත්‍රාත්කරුගෙන් ගෙවීම් ලබාගන්නේ කුමන මුදල් ඒකකයකින් ද එම මුදල් ඒකකයෙන්ම වාර්ෂික බලපත්‍ර ගාස්තුව අධිකාරිය වෙත ගෙවනු ලැබිය යුතු ය.

### I වන උපලේඛනය

(3 වන නියෝගය)

#### සේවා සැපයීමේ බලපත්‍ර අයදුම්පත්‍රය

| | | | |
|---|---|---|---|
| | | | |
| අයදුම්කරුගේ නම | | දේශීය/නේවාසික | ☐ |
| | | විදේශීය/නේවාසික නොවන | ☐ |
| ලිපිනය | | | |
| විද්‍යුත් තැපැල් ලිපිනය | | | |
| දුරකතන අංකය : | | ෆැක්ස් අංකය : | |
| සමාගම් හිමියන්/පාර්ශවකරුවන්ගේ නම සහ ලිපිනය | | | |

| | |
|---|---|
| සමාගම් සංස්ථාගත කිරීමේ අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය | |
| ව්‍යාපාර ලියාපදිංචි අංකය | |
| සපයනු ලබන භාණ්ඩ හෝ සේවා (ගිවිසුමේ නම) | |
| ගිවිසුම් අංකය හා අගය (ඇමෙරිකානු ඩොලර්) | |
| ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ නම | |

බලයලත් නියෝජිතයාගේ විස්තර සහ අත්සන

අත්සන :
නම :
තනතුර :
දුරකතන අංකය :
ෆැක්ස් අංකය :
දිනය : විද්‍යුත් තැපැල :

ශ්‍රී ලංකාවේ නියෝජිතයෙක් සිටින්නේ නම් එම නියෝජිතයාගේ නම සහ විස්තර

අයදුම්පත සමඟ පහත ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(අ) අදාළ සමාගම හෝ තනි පුද්ගලයාගේ සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළත් සවිස්තරාත්මක විස්තරය ;
(ආ) ප්‍රතිපත්ති හෝ, වාර්තා අදාල වන්නේ නම් ඒවා ද ඇතුළත්ව තත්ත්ව, සෞඛ්‍ය, සුරක්ෂිතතාව සහ පාරිසරික තත්ත්ව පිළිබඳ ප්‍රකාශයන් ;
(ඇ) සංස්ථාගත කිරීමේ සහතිකයෙහි හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපත ;
(ඈ) යෝජිත ව්‍යාපෘති වැඩසටහන් ලැයිස්තුව ඇතුළත් කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයෙහි පිටපත.

ඉහත ලේඛන සියල්ල ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

අදාළ ගාස්තුව සමග අයදුම්පත්‍රය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධාන මත dg@pdasl.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ පහත දැක්වෙන ලිපිනය වෙත එවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය,
6 වන මහල, සෙලින්කෝ මන්දිරය, ජනාධිපති මාවත,
කොළඹ 01,
ශ්‍රී ලංකාව.

දූ.ක. : 94112332002 ෆැක්ස් : 94112332003
විද්‍යුත් තැපැල : dg@pdasl.gov.lk

**II උපලේඛනය**

(5 වන නියෝගය)

බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| *ගිවිසුමේ වටිනාකම* | *අදාළ බලපත්‍ර ගාස්තුව/වර්ෂයක් සඳහා* |
|---|---|
| ඇමෙරිකානු ඩොලර් 100,000 දක්වා | ඇමෙරිකානු ඩොලර් 100 |
| ඇමෙරිකානු ඩොලර් 100,000 වැඩි සහ 500,000ට අඩු හෝ සමාන | ඇමෙරිකානු ඩොලර් 500 |
| ඇමෙරිකානු ඩොලර් 500,000 වැඩි සහ 1,000,000ට අඩු හෝ සමාන | ඇමෙරිකානු ඩොලර් 1,000 |
| ඇමෙරිකානු ඩොලර් 1,000,000 සිට ඉහළට | ඇමෙරිකානු ඩොලර් 2,500 |

EOG 01 0024/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.